# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,114—1960 අප්‍රේල් 23 වැනි සෙනසුරාද—23.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : C. 214/55.

### 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 25 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, අග්‍රාණ්ඩුකාර තැන්පත් ඔලිවර් අර්නස්ට් ගුණතිලක වන මම, මේ දැන්වීමෙන්—

(අ) මෙහි පහත දක්වෙන උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් මැතිවරණ කොට්ඨාශයන් සඳහා ඒ උපලේඛනයේ II වෙනි තීරයේ සඳහන් තැනැත්තා තේරීම් භාර නිලධාරියා වශයෙන් ද,

(ආ) ඒ උපලේඛනයේ III වෙනි තීරයේ සඳහන් තැනැත්තන්, ඒ උපලේඛනයේ II වෙනි තීරයේ සඳහන් තේරීම් භාර නිලධාරියාට, තම රාජකාරි කටයුතු වලදී සහාය වීම පිණිස ද, පත් කරන අතර ම

(ඇ) ඉහතකී I වෙනි තීරයෙහි සඳහන් කරනු ලැබූ මැතිවරණ කොට්ඨාශ සම්බන්ධයෙන්, තේරීම් භාර නිලධාරියා වශයෙන් හා සහකාර තේරීම් භාර නිලධාරීන් වශයෙන් ඒ වගන්තිය යටතේ කරනු ලැබූ ද, 1959 නොවැම්බර් 3 වෙනි දින අංක 11,937 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ද, පත් කිරීම් අවලංගු කරමි.

ඕ. ඊ. ගුණතිලක,
අග්‍රාණ්ඩුකාර තැන.

1960 අප්‍රේල් 23 වෙනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| I<br>මැතිවරණ කොට්ඨාශය | II<br>තේරීම් භාර නිලධාරිතැන | III<br>සහකාර තේරීම් භාර නිලධාරිතැන |
|---|---|---|
| අංක 121—බිබිලේ | මොනරාගල පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති තැන | මොනරාගල කච්චේරියේ ප්‍රාදේශීය ඉඩම් නිලධාරිතැන |
| අංක 129—මොනරාගල | (same as above) | මොනරාගල දිස්ත්‍රික්කයේ සහකාර මැතිවරණ නිලධාරිතැන |


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

467—ජේ. ඇන්. ආර් 9356—4,500 (4/60)